# කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 3 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**01.** සම්බන්ධ වන ආයතනය

1.1 දෙපාර්තමේන්තුව:

1.2 අමාත්‍යාංශය : කෘෂිකර්ම අමාත්‍යාංශය යොමු අංකය : 2/1/1/4/2 MT -1 දිනය : 2012.11.07

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම යොමු අංකය: DMS/G2/43(Vol.l) දිනය : 2012.11.07

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය: EST-2/RECRU/02/0231 දිනය : 2013.05.14

1.5 වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය: NSCC/S/42/SR දිනය : 2013.04.26

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය: PSC/EST/06-01-42/10/2013 දිනය : 2014.05.09

**02.** පත්කිරීමේ බලධාරියා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

| | | |
|---|---|---|
| 3.1 සේවා ගණය | : | කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය - 3 |
| 3.2 ශ්‍රේණිය | : | III, II, I |

3.3 කාර්ය භාර්ය පිළිබඳ පොදු නිර්වචනය :

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් යටතේ ඇති සියලුම නව ඉදිකිරීම් වැඩි දියුණු කිරීම හා අලුත් වැඩියා කිරීම සඳහා වන වැඩ පරික්ෂා කිරීමට සහ ඉදිකිරීම් වලට අදාල සැලසුම් නිර්මාණය කිරීමට සහාය වීම හා පවරනු ලබන තනතුරට අදාළ වෙනත් රාජකාරී කටයුතු.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින්, ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත යෝෂ්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

**04.** තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

**05.** වැටුප්

**5.1** වැටුප් කේත අංකය : **MT 1 – 2006A**

**5.2** වැටුප් පරිමාණය : රු. **14,425 – 10 x 145 – 11 x 170 – 6 x 240 – 14 x 320 – 23,655**

**5.3** ශ්‍රේණියට අදාළ ආරම්භක වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු:) |
|---|---|---|
| III | පියවර 01 | රු.14, 425 |
| II | පියවර 12 | රු.16, 045 |
| I | පියවර 23 | රු.17, 985 |

**06.** සේවා ගණයට අයත් තනතුර / තනතුරුවල ස්වභාවය

**6.1** අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| තාක්ෂණ සහයක | | 01 | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් යටතේ ඇති සියලුම නව ඉදිකිරීම් වැඩි දියුණු කිරීම හා අලුත් වැඩියා කිරීම සඳහා වන වැඩ පරික්ෂා කිරීමට සහ ඉදිකිරීම්වලට අදාල සැලසුම් නිර්මාණය කිරීමට සහාය වීම හා පවරනු ලබන තනතුරට අදාල වෙනත් රාජකාරී කටයුතු. |

**6.2** ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : තාක්ෂණ සහායක - 01

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

### 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්:

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :

ඉහත 7.2.2.1 හි සඳහන් අධ්‍යාපන සුදුසකම් සහිතව ජාතික වෘත්තීය සුදුසකම් වල 05 මට්ටමේ පාඨමාලාවක් සහතිකය (NVQ) ලබා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7.2.2.5 වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළ කරන දිනට 7.2.2 හා 7.2.3 දක්වා සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණ |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| තාක්ෂණ ප්‍රශ්ණ පත්‍රය | 100 | 40 |

7.2.4.1.1 පවත්වන බලධරයා : කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.2.1 වෘත්තීය පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබාදෙනු නොලැබේ)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : - බඳවා ගැනීමේ පරිපාටි සහ ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කරන බලධාරියා : කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කරන බලධරයා: අදාළ නොවේ